සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....

භූගෝල විද්‍යාව - I

කාලය පැය 03 යි

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I කොටස

01. ශ්‍රී ලංකා 1:50,000 හු ලක්ෂණ සිතියම් ශ්‍රේණිය සිතියම් පත්‍ර කීයකින් මුද්‍රණය කර ඇත් ද?
(i) 75 (ii) 80 (iii) 89
(iv) 92 (v) 95 (.........)

02. මුහුදේ හෝ ගොඩබිම හෝ ගුවනේ හෝ ගමන් කරන අවස්ථාවල දී එම යානා පදවන්නන් ගමනාන්තය දක්වා නිවැරදි ව ගමන් මග පෙන්නුම් කිරීම සඳහා යොදාගන්නා නවීන සිතියම් විද්‍යාත්මක ක්‍රම ශිල්පය හඳුන්වනු ලබන්නේ,
(i) සෙවීම (Searching) ලෙස ය. (ii) සංවේදය (Sensing) ලෙස ය.
(iii) යාත්‍රණය (Navigation) ලෙස ය. (iv) සිතියම්කරණය (Mapping) ලෙස ය.
(v) විශ්ලේෂණය (Analyzing) ලෙස ය. (.........)

03. දුරස්ථ සංවේද (RS) තාක්ෂණයේ දී භාවිතා වන අහස් නැව්, බැලුන්, හෙලිකොප්ටර් වැනි යානාවන් අයත් වන්නේ,
(i) අභ්‍යවකාශ වේදිකා ගනයට ය. (ii) වාසර වේදිකා ගනයට ය. (iii) ගුවන් ඡායාරූප ගනයට ය.
(iv) භූමි පාදක වේදිකා ගනයට ය. (v) චන්ද්‍රිකා ගනයට ය. (.........)

04. 1:50,000 හු ලක්ෂණ සිතියම් පත්‍රයක පහළ වට තීරුවේ දැක්වෙන තොරතුරු පමණක් අඩංගු වන නිවැරදි වරණය තෝරන්න.
(i) පරිමාණය, යාබද සිතියම් යොමුව, සිතියමේ නම (ii) දිශා සටහන, පරිමාණය, යාබද සිතියම් යොමුව
(iii) සිතියම් වර්ගය, මූලාශ්‍රය, දිශා සටහන (iv) පරිමාණය, සිතියම් වර්ගය, සිතියම් අංකය
(v) දිශා සටහන, සිතියම් වර්ගය, පරිමාණය (.........)

05. ක්‍රි.ව. 1854 දී ජෝන් ස්නෝ නම් වෛද්‍යවරයා විසින් සිතියම් විද්‍යාත්මක ශිල්පක්‍රමයක් භාවිතා කරන ලද්දේ,
(i) පැරිස් නගරයේ කොළරා වසංගතය පැතිරීම අධ්‍යයනය කිරීමට ය.
(ii) නිව්යෝර්ක් නගරයේ කොළරා වසංගතය පැතිරීම අධ්‍යයනය කිරීමට ය.
(iii) ලන්ඩන් නගරයේ කොළරා වසංගතය පැතිරීම අධ්‍යයනය කිරීමට ය.
(iv) ලන්ඩන් නගරයේ මහාමාරිය වසංගතය පැතිරීම අධ්‍යයනය කිරීමට ය.
(v) පැරිස් නගරයේ මහාමාරිය වසංගතය පැතිරීම අධ්‍යයනය කිරීමට ය. (.........)

06. 1:50,000 නව සිතියම් සූචකයේ අධිවේගී මාර්ග (Expressway) නිරූපණය කරනු ලබන්නේ,
(i) රතු වර්ණයෙනි. (ii) කළු වර්ණයෙනි. (iii) නිල් වර්ණයෙනි.
(iv) කහ වර්ණයෙනි. (v) දම් වර්ණයෙනි. (.........)

07. මෙහි දැක්වෙන භූගෝලීය තොරතුරු පද්ධතියේ (GIS) ආදාන උපාංග නිවැරදි ව පිළිවෙළින් නම් කර ඇති වරණය තෝරන්න.



(i) තිර සංඛ්‍යාංකය, චුම්භක තැටි, සුපරික්සනය

(ii) සුපරික්සනය, දෘශ්‍ය තැටි, තිර සංඛ්‍යාංකය

(iii) චුම්භක පටි, සුපරික්සනය, තිර සංඛ්‍යාංකය

(iv) මුද්‍රණ යන්ත්‍රය, චුම්භක තැටි, සුපරික්සනය

(v) තිර සංඛ්‍යාංකය, චුම්භක තැටි, මුද්‍රණ යන්ත්‍රය (.........)

08. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ (GPS) මෙහෙයුම් මධ්‍යස්ථාන අතරින් ඉන්දියන් සාගර කලාපයේ පිහිටා ඇති මෙහෙයුම් මධ්‍යස්ථානයක් දැක්වෙන වරණය තෝරන්න.

(i) ඇසෙන්ෂන් දූපත් (ii) හවායි දූපත් (iii) කොලරාඩෝ ස්ප්‍රින්ග්

(iv) දියාගෝ ගාර්ෂියා (v) ක්වාලෙයින් දූපත් (.........)

09. භූමිය මත $9\ km^2$ ක ව්‍යාප්තියක් ඇති වගාබිමක් 1:50,000 භූ ලක්ෂණ සිතියමක නිරූපණය කිරීමට අවශ්‍ය වර්ග සෙන්ටිමීටර් ප්‍රමාණය කොපමණක් ද ?

(i) 4.5 (ii) 18 (iii) 27

(iv) 32 (v) 36 (.........)

10. රූපසටහනේ දැක්වෙන පරිදි අභ්‍යවකාශයේ එක් ස්ථාවර ස්ථානයක නිත්‍ය වශයෙන් පිහිටුවා ඇති දුරස්ථ සංවේද චන්ද්‍රිකා වර්ග හඳුන්වනු ලබන්නේ,



(i) කාලගුණ චන්ද්‍රිකා නමින් ය.

(ii) ඔත්තු බැලීමේ චන්ද්‍රිකා නමින් ය.

(iii) ධ්‍රැවක කක්ෂ චන්ද්‍රිකා නමින් ය.

(iv) අභ්‍යවකාශ ගවේෂණ චන්ද්‍රිකා නමින් ය.

(v) භූ සමකාලීන චන්ද්‍රිකා නමින් ය. (.........)

11. පෘථිවි ප්‍රාවරණය හා හරය වෙන් කරන සීමාව හඳුන්වනුයේ,

(i) සියල් ස්තරය ලෙස ය. (ii) ගුටෙන්බර්ග් අසන්තතිය ලෙස ය.

(iii) සිමා ස්තරය ලෙස ය. (iv) ලේමන් අසන්තතිය ලෙස ය.

(v) මොහොරවිසික් අසන්තතිය ලෙස ය. (.........)

12. පෘථිවිය මතුපිට සිට අභ්‍යන්තරයට යන විට,

(i) උෂ්ණත්වය වැඩි වන අතර පීඩනය ද වැඩි වේ. (ii) උෂ්ණත්වය අඩු වන අතර පීඩනය වැඩි වේ.

(iii) ආර්ද්‍රතාවය වැඩි වන අතර උෂ්ණත්වය අඩු වේ. (iv) පීඩනය අඩු වන අතර උෂ්ණත්වය වැඩි වේ.

(v) පීඩනය වැඩි වන අතර ආර්ද්‍රතාවය අඩු වේ. (.........)

13. වායුගෝලයේ ඉහළ යන විට උෂ්ණත්වයේ සිදුවන අඩු වීම නිවැරදි ව දැක්වෙන්නේ කුමන පිළිතුරේ ද?

(i) සෑම මීටර් 100 කට ම $6.4^{\circ}C$ බැගින් ය. (ii) සෑම මීටර් 1000 කට ම $6.4^{\circ}C$ බැගින් ය.

(iii) සෑම මීටර් 1000 කට ම $64^{\circ}C$ බැගින් ය. (iv) සෑම මීටර් 1000 කට ම $94^{\circ}C$ බැගින් ය.

(v) සෑම මීටර් 100 කට ම $9.4^{\circ}C$ බැගින් ය. (.........)

14. භෞතික භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් **නොවන** විෂය කාණ්ඩ පමණක් සඳහන් වන වරණය තෝරන්න.

(i) පාංශු විද්‍යාව, ජල විද්‍යාව
(ii) පරිසර භූගෝල විද්‍යාව, දේශගුණ විද්‍යාව
(iii) ජෛව භූගෝල විද්‍යාව, භූ විද්‍යාව
(iv) දේශගුණ විද්‍යාව, සාගර විද්‍යාව
(v) මානව විද්‍යාව, වෛද්‍ය භූගෝල විද්‍යාව (.........)

15. දැනට නිශ්චල ව පවතින නමුත් අනාගතයේ පුපුරා යා හැකි යමහල් හඳුන්වනු ලබන්නේ,

(i) මළ යමහල් ලෙස ය.
(ii) පලිස් යමහල් ලෙස ය.
(iii) සංයුක්ත යමහල් ලෙස ය.
(iv) නිදන යමහල් ලෙස ය.
(v) සක්‍රීය යමහල් ලෙස ය. (.........)

16. ශක්තිය (Energy) හා පදාර්ථ (Matter) පිටතින් ලබා ගැනීම සහ පිට කිරීම සිදුවන පද්ධති වර්ගය මින් කුමක් ද?

(i) භූදෙකලා පද්ධති
(ii) ශිලාගෝලීය පද්ධති
(iii) ආවෘත පද්ධති
(iv) ජෛවගෝලීය පද්ධති
(v) විවෘත පද්ධති (.........)

17. පීට්, තෝරියනයිට්, මොනසයිට් වැනි බලශක්තිමය ඛනිජ වර්ග හමුවන ප්‍රදේශ පමණක් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(i) නුවරඑළිය, මුතුරාජවෙල, ඉඳුරුව
(ii) වස්කඩුව, දියතලාව, සේරුවාවිල
(iii) මුතුරාජවෙල, පුල්මුඩේ, කයිකාවල
(iv) මාතලේ, දුම්බර, රත්නපුර
(v) විලගෙදර, මීටියාගොඩ, ගාල්ල (.........)

18. "පෘථිවි භූ පද්ධති තුළ ජලය සංසරණය වීම" හඳුන්වනු ලබන්නේ,

(i) ජල දූෂණය ලෙස යි.
(ii) ජල මූලාශ්‍ර ලෙස යි.
(iii) ජල සංරක්ෂණය ලෙස යි.
(iv) ජල අධිභාවිතය ලෙස යි.
(v) ජල චක්‍රය ලෙස යි. (.........)

19. ආග්නේය හා විපරීත පාෂාණ සඳහා උදාහරණ පිළිවෙළින් අඩංගු වන නිවැරදි පිළිතුර තෝරන්න.

(i) ග්‍රැනයිට්, වැලිගල්
(ii) ගල්අඟුරු, බොරළු
(iii) නයිස්, ඩොලමයිට්
(iv) ඩොලමයිට්, යගල්
(v) ග්‍රැනයිට්, කිරිගරුඬ (.........)

20. යම්කිසි ප්‍රදේශයක දක්නට ලැබෙන පසක වයනය හා වර්ණය මෙන් ම පසෙහි අඩංගු ඛනිජ පෝෂක කෙරෙහි බලපාන ප්‍රධාන භෞතික සාධකය වන්නේ,

(i) කාලය යි.
(ii) මව් පාෂණය යි.
(iii) ජලය හා ජලවහනය යි.
(iv) භූ විෂමතාවය යි.
(v) දේශගුණය යි. (.........)

21. ශ්‍රී ලංකාවට සංවහන වැසි ලැබෙන අන්තර්-මෝසම් කාලයන් නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?

(i) මාර්තු-අප්‍රේල් හා ඔක්තෝබර්-නොවැම්බර්
(ii) මාර්තු-අප්‍රේල් හා මැයි-සැප්තැම්බර්
(iii) ජනවාරි-පෙබරවාරි හා මැයි-ජුනි
(iv) මාර්තු-අප්‍රේල් හා මැයි-ජුනි
(v) අප්‍රේල්-මැයි හා ඔක්තෝබර්-නොවැම්බර් (.........)

22. ශිලාගෝලයේ භූ තැටි අතුරින් මහාද්වීපික තැටි පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.

(i) ඉන්දු-ඕස්ට්‍රේලියා තැටිය, ඉරාන තැටිය, පැසිෆික් තැටිය
(ii) නැස්කා තැටිය, කොකොස් තැටිය, පැසිෆික් තැටිය
(iii) යුරේෂියන් තැටිය, ඉන්දු-ඕස්ට්‍රේලියා තැටිය, දකුණු ඇමරිකානු තැටිය
(iv) කොකොස් තැටිය, පැසිෆික් තැටිය, ඇන්ටාක්ටික් තැටිය
(v) පැසිෆික් තැටිය, පිලිපීන තැටිය, අප්‍රිකානු තැටිය (.........)

23. සවිරාම ජලවහන ලක්ෂණයක් දක්නට ලැබෙන්නේ,

(i) සමාන්තර හෙල් වැටි සහිත ප්‍රදේශවල ය. (ii) උඩු නැමි මණ්ඩල පිහිටා ඇති ප්‍රදේශවල ය.
(iii) වෙරළබඩ ප්‍රදේශවල ය. (iv) කඳුකර ප්‍රදේශවල ය.
(v) හුණුගල් පාෂාණ ස්තර ඇති ප්‍රදේශවල ය. (.........)

24. කර්මාන්තශාලාවලින් හෝ නිවාසවලින් හෝ නිකුත් වන දූවිලි හා වෙනත් දූෂක අංශු ආශ්‍රිත ව ජල වාෂ්ප ඝනීභවනය වීමෙන් නිර්මාණය වන්නේ,

(i) මීදුම (ii) තුහින (iii) වළාකුළු
(iv) ධූමිකා (v) අම්ල වැසි (.........)

25. මෙම රූප සටහනෙහි A, B, C ලෙස නම් කර ඇති ආක්‍රාන්ත යමහල් භූ රූප නිවැරදි ව පිළිවෙළින් නම් කර ඇති වරණය තෝරන්න.



(i) ලොපොලිත, ලැකොලිත, ආස්තර
(ii) බැතොලිත, ලැකොලිත, පාකොලිත
(iii) බැතොලිත, ලොපොලිත, ආස්තර
(iv) බැතොලිත, ඩයික, ලැකොලිත
(v) බැතොලිත, පාකොලිත, ආස්තර (.........)

26. 1960 දශකය අග භාගයේ සිට ශ්‍රී ලංකාවට බලපෑ හරිත විප්ලවයේ, වැඩි බලපෑමක් එල්ල වූ ක්ෂේත්‍රය වන්නේ,

(i) වී ගොවිතැන යි. (ii) එළවළු වගාව යි. (iii) සත්ත්ව පාලනය යි.
(iv) ධීවර කර්මාන්තය යි. (v) පලතුරු වගාව යි. (.........)

27. නායයෑම්, යුධ තත්ත්වය, සුනාමි ආදී හේතුන් නිසා සිදුවන්නා වූ ජන සංඛ්‍යාව ආශ්‍රිත සංසිද්ධිය වන්නේ,

(i) සරණාගත වීම යි. (ii) සංක්‍රමණය යි. (iii) විගමනය යි.
(iv) අවතැන් වීම යි. (v) ආගමනය යි. (.........)

28. ලොව ජනාධිකත ම රටවල් දහය අතර වැඩි ම රටවල් සංඛ්‍යාවක් අයත් වන කලාපය වන්නේ,

(i) අප්‍රිකා මහාද්වීපය යි. (ii) ආසියා මහාද්වීපය යි. (iii) උතුරු ඇමරිකා මහාද්වීපය යි.
(iv) යුරෝපා මහාද්වීපය යි. (v) දකුණු ඇමරිකා මහාද්වීපය යි. (.........)

29. යම් රටක ස්වභාවික වර්ධන වේගය ඍණ (-) අගයක් ගැනීමෙන් පෙන්නුම් කෙරෙන්නේ,

(i) උපත් සංඛ්‍යාව අභිබවා මරණ සංඛ්‍යාව ඉහළ යාමයි.
(ii) මරණ සංඛ්‍යාව අභිබවා උපත් සංඛ්‍යාව ඉහළ යාමයි.
(iii) උපත් සංඛ්‍යාව අභිබවා සංක්‍රමණ ඉහළ යාමයි.
(iv) මරණ සංඛ්‍යාව අභිබවා සංක්‍රමණ සංඛ්‍යාව ඉහළ යාමයි.
(v) සංක්‍රමණ සංඛ්‍යාව අභිබවා උපත් සංඛ්‍යාව ඉහළ යාමයි. (.........)

30. ලොව මුහුන් කරන ලද වී වගා කර ඇති භූමි ප්‍රමාණය වැඩි ම රට දැක්වෙන වරණය තෝරන්න.
(i) තායිලන්තය (ii) ඉතාලිය (iii) ඉන්දියාව
(iv) ජපානය (v) වියට්නාමය (.........)

31. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පමණක් අඩංගු වන වරණය තෝරන්න.
(i) දඹුල්ල - මීගොඩ - නාරාහේන්පිට (ii) තඹුත්තේගම - වැලිසර - වව්නියාව
(iii) වැලිසර - මීගමුව - හලාවත (iv) කැප්පෙටිපොල - තඹුත්තේගම - මාවතගම
(v) අම්පාර - තලාව - දඹුල්ල (.........)

32. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යාප්තිය අනුව මිලියන එකකට (01) වැඩි ජන සංඛ්‍යාවක් වාසය කරන දිස්ත්‍රික්ක දෙකක් නිවැරදි ව නම් කර ඇති අක්ෂර දෙක දක්වන වරණය කුමක් ද ?
(i) A - E
(ii) B - E
(iii) A - C
(iv) C - D
(v) A - B (.........)



33. 2012 ජන සංගණන දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වාර්ෂික වර්ධන වේගය අඩු ම අගය වාර්තා වන දිස්ත්‍රික්කය දැක්වෙන්නේ කිනම් අක්ෂරයෙන් ද?
(i) A (ii) B (iii) C (iv) D (v) E (.........)

34. මානුෂ භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත් උප විෂයයන් පමණක් ඇතුළත් වන වරණය කුමක් ද?
(i) ජනාවාස භූගෝල විද්‍යාව - වෛද්‍ය භූගෝල විද්‍යාව - භූ රූප විද්‍යාව
(ii) දේශගුණ විද්‍යාව - නාගරික භූගෝල විද්‍යාව - ග්‍රාමීය භූගෝල විද්‍යාව
(iii) කාර්මික භූගෝල විද්‍යාව - සිතියම් විද්‍යාව - භූ විද්‍යාව
(iv) දේශපාලන භූගෝල විද්‍යාව - නාගරික භූගෝල විද්‍යාව - සංවර්ධන භූගෝල විද්‍යාව
(v) කාළගුණ විද්‍යාව - ජෛව භූගෝල විද්‍යාව - දේශගුණ විද්‍යාව (.........)

35. ශ්‍රී ලංකාවේ අඩු ම හා වැඩි ම නාගරික ජන සංඛ්‍යාවක් වාසය කරන දිස්ත්‍රික්ක දෙකක් වන්නේ,
(i) පුත්තලම හා කළුතර (ii) යාපනය හා කොළඹ (iii) අම්පාර හා ගම්පහ
(iv) නුවරඑළිය හා මහනුවර (v) කුරුණෑගල හා කොළඹ (.........)

36. එක්සත් ජාතීන්ගේ ජනගහන අංශයේ වාර්තා අනුව ඉහළ යැපෙන්නන් ලෙස සලකනු ලබන්නේ,
(i) වයස අවුරුදු 50 (ii) වයස අවුරුදු 55 (iii) වයස අවුරුදු 60
(iv) වයස අවුරුදු 65 (v) වයස අවුරුදු 70 (.........)

37. ලෝක ජන සංඛ්‍යාව බිලියන 01 බවට පත්වූ වර්ෂය ලෙස සැලකෙන්නේ මින් කුමන වර්ෂය ද ?
(i) 1804 (ii) 1999 (iii) 2009 (iv) 2012 (v) 2018 (.........)

38. A - සැලසුම් කළ ජනාවාසයකි.
B - පොදු පහසුකම් හා ජනාවාස රේඛීය ස්වරූපයෙන් ගොඩනගා ඇත.
C - මාතලේ, බදුල්ල, නුවරඑළිය, මහනුවර වැනි දිස්ත්‍රික්ක වල බහුල ව ව්‍යාප්තව ඇත.
මෙම ලක්ෂණ දක්නට ලැබෙන ජනාවාස වර්ගය වන්නේ,
(i) වතු ජනාවාස
(ii) මහවැලි ගම්මාන
(iii) තරුණ ගම්මාන
(iv) ධීවර ජනාවාස
(v) කඳුරට සාම්ප්‍රදායික ගම්මාන (.........)

39. "පෘථිවියේ අවකාශීය විවිධත්වය පිළිබඳ අධ්‍යයනය කිරීම භූගෝල විද්‍යාව" ලෙස අර්ථ දක්වනු ලැබුවේ,
(i) කාල් රිටර් විසින් ය.
(ii) මොරිස් ඩේවිස් විසින් ය.
(iii) ඔස්ටින් මිලර් විසින් ය.
(iv) වොන් හම්බෝල්ට් විසින් ය.
(v) රිචඩ් හාර්ට්ෂෝන් විසින් ය. (.........)

40. 'දළ මරණ අනුපාතිකය' ලෙස හඳුන්වනු ලබන්නේ,
(i) මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් සියයකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(ii) මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් දහසකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(iii) වාර්ෂික ජන සංඛ්‍යාවෙන් සියයකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(iv) මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් දස දහසකට සිදුවන මරණ සංඛ්‍යාවයි.
(v) වාර්ෂික ජන සංඛ්‍යාවෙන් දහසකට සිදුවන මරණ සංඛ්‍යාවයි. (.........)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....

භූගෝල විද්‍යාව - I

- **II කොටසේ එක හා දෙක ප්‍රශ්න දෙකටත්, III කොටසින් ප්‍රශ්න දෙකකුත් තෝරාගෙන ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

II කොටස

- **ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ භූ ලක්ෂණ සිතියමකින් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20 කි. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

01). i. සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන මායිම් වර්ග **දෙකක්** නම් කරන්න. (ල.2)

ii. A-B රේඛාවෙන් දැක්වෙන බෑවුම කුමක් ද? (ල.2)

iii. සිතියම් ප්‍රදේශයේ දක්නට ලැබෙන බෝග වගාවන් **දෙකක්** නම් කරන්න. (ල.2)

iv. අංක (1) චතුරස්‍රයේ දැක්වෙන ලක්ෂණය කුමක් ද ? එම ස්ථානයේ තිබිය හැකි උපරිම උස කොපමණක් දැයි සඳහන් කරන්න. (ල.2)

v. මාර්ග කොටසේ දිග ගණනය කරන්න. (ල.2)

vi. C අක්ෂරයෙන් දැක්වෙන භෞතික ලක්ෂණය හා D අක්ෂරයෙන් දැක්වෙන ජලවහන ලක්ෂණය නම් කරන්න. (ල.2)

vii. අංක (2) චතුරස්‍රය දෙගුණයකින් විශාලනය කර ඇඳ, එහි අඩංගු වන මාර්ග පමණක් ඇඳ දක්වන්න. (ල.3)

viii. භූ විෂමතාව හා භූමි පරිභෝගය අතර දක්නට ලැබෙන සම්බන්ධතාව උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ල.6)

02). ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් දෑ සම්මත වර්ණ, සංකේත හා අක්ෂර භාවිතා කරමින් ලකුණු කර නම් කරන්න.

i. ගෝබි කාන්තාරය
ii. බ්‍රිතාන්‍ය දූපත්
iii. බාස් සමුද්‍ර සන්ධිය
iv. ටිටිකාකා විල
v. ඔයාෂිවෝ ප්‍රවාහය
vi. යුකටාන් අර්ධද්වීපය
vii. මකර නිවර්තනය
viii. ගිනි බොක්ක
ix. ඉන්දියාවේ අගනුවර
x. 2023 සැප්තැම්බර් මාසයේ ජල ගැලීම් හේතුවෙන් ආපදාවට ලක් වූ අප්‍රිකානු රට

III කොටස

03) (i) සිතියමක් යනු කුමක් දැයි හඳුන්වන්න. (ල.3)

(ii) අන්තර්ගතවන තොරතුරු අනුව ප්‍රධාන සිතියම් වර්ග **දෙක** නම් කර, උදාහරණ **දෙක** බැගින් දක්වන්න. (ල.3)

(iii) ඉන් එක් වර්ගයක ලක්ෂණ පැහැදිලි කරන්න. (ල.4)

(iv) ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ දී ඡායාරූප හා ප්‍රතිබිම්බ භාවිතා කරන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.5)

04. (i) භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) යන්න හඳුන්වන්න. (ල.3)

(ii) භූගෝලීය තොරතුරු පද්ධතියේ පහත දැක්වෙන සංරචක සඳහා උදාහරණ **දෙක** බැගින් නම් කරන්න.

a. දෘඪාංග

b. මෘදුකාංග

c. භාවිතා කරන්නන් (ල.3)

(iii) භූගෝලීය තොරතුරු පද්ධතියක අඩංගු දත්ත ගබඩා කිරීමේ ප්‍රධාන ආකෘති **දෙක** නම් කර, ඉන් එක් වර්ගයක් පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.5)

(iv) භූගෝලීය තොරතුරු පද්ධතියේ ප්‍රායෝගික වැදගත්කම/භාවිතය කරුණු **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ල.4)

05. i. පහත දැක්වෙන භූ ලක්ෂණ නිවැරදිව හඳුනාගෙන නම් කරන්න. (ල.4)



ii. a). 1:50,000 භූ ලක්ෂණ සිතියමක 4 km^2 ක් නිරූපණය කරන භූමි ප්‍රදේශයක් දෙගුණයකින් සංකෝචනය කල පසු එය නිරූපණය කරන චතුරස්‍රයක් නිවැරදි පරිමාණයෙන් ඇඳ දක්වන්න. (ල.2)

b) 1:50,000 රේඛීය පරිමාණය නිවැරදි ව ඇඳ දක්වන්න. (ල.5)

iii. ශ්‍රී ලංකාවේ 1:50,000 භූ ලක්ෂණ සිතියම්වල දිශාව (උතුර) දක්වා ඇති ප්‍රධාන ආකාර **දෙක** නිවැරදි ව ඇඳ නම් කරන්න. (ල.4)

06. i. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) හඳුන්වන්න. (ල.2)

ii. සිතියමෙහි ලකුණු කර ඇති ගෝලීය ස්ථාන ගත කිරීමේ පද්ධතියේ මෙහෙයුම් මධ්‍යස්ථාන නිවැරදිව නම් කරන්න. (ල.4)



iii. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියේ මූලිකාංග අතරින් පාලන කොටස (Control Segment) පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ල.4)

iv. භූගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ශ්‍රී ලංකාවේ භාවිත කිරීමේ දී මතුවන ගැටළු **දෙකක්** උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ල.05)

****

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023

Third Term Test - Grade 12 - 2023

විභාග අංකය: ....

භූගෝල විද්‍යාව - II

කාලය පැය 03 යි

අමතර කියවීමේ කාලය මිනිත්තු 10 යි.

- **එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01\. i. 'ජල චක්‍රය' යන්න කෙටියෙන් හඳුන්වන්න. (ල.2)

ii. ජල චක්‍රයේ ක්‍රියාකාරිත්වය සරල රූප සටහනකින් නිරූපණය කර එහි ප්‍රධාන සංරචක **දෙකක්** විස්තර කරන්න. (ල.6)

iii. ජල චක්‍රයේ දිගු කාලීන බලපෑම් **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ල.6)

iv. ජලයේ ගුණාත්මක භාවය වෙනස්වීම මානුෂ ක්‍රියාකාරකම් කෙරෙහි බලපාන ආකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ල.6)

02). i. පාංශු නිර්මාණ ක්‍රියාවලියට දායකවන භෞතික සාධක **හතරක්** නම් කරන්න. (ල.2)

ii. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පාංශු ගණ අතරින්,

a. තෙත් කලාපයට සීමා වූ හා පාංශු ගණයක හා

b. වියළි කලාපයට සීමා වූ පාංශු ගණයක ලක්ෂණ විස්තර කරන්න. (ල.6)

iii. කෘෂිකාර්මික කටයුතු පසේ ගුණාත්මක භාවය කෙරෙහි බලපාන ආකාරය කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට ලෝහමය නොවන ඛනිජ සම්පත් දායකවන අකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ල.6)

03). i. මෙම සිතියමෙහි ලකුණු කර ඇති යමහල් නම් කරන්න. (ල.2)

ii. නිෂ්ක්‍රාන්ත යමහල් ආශ්‍රිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය සුදුසු රූපසටහන් යොදාගනිමින් විස්තර කරන්න (ල.6)

iii. ගංගා නිධිසාදිත භූ රූප **තුනක** නිර්මාණ ක්‍රියාවලිය සුදුසු රූපසටහන් යොදාගනිමින් විස්තර කරන්න. (ල.6)

iv. ග්ලැසියර් භූ රූප ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් **තුනක්** නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ල.6)

04). i. පහත දැක්වෙන කාලගුණ මූලිකාංග මිනුම් කරනු ලබන උපකරණය හා ඒ සඳහා භාවිත කරන ඒකකයන් පිළිවෙළින් නම් කරන්න.

a. වායුගෝලීය පීඩනය

b. සුළඟේ වේගය (ල.2)

ii. භූගෝලීය වශයෙන් දේශගුණ විවිධත්වයන් ඇති වීම කෙරෙහි බලපාන සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ල.6)

iii. නිවර්තන දේශගුණ (A) වර්ගයේ ඇති උප දේශගුණ වර්ග නම් කර, ඉන් **එකක** කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ දේශගුණයේ සුවිශේෂත්වය මානව ක්‍රියාකාරකම් කෙරෙහි බලපා ඇති ආකාරය නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න (ල.6)

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05). i. ශ්‍රී ලංකාවේ යැපුම් අනුපාතයේ කාලීන වෙනස්වීම් දක්වන මෙම ප්‍රස්තාරයෙන් හඳුනාගත හැකි කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ල.2)



ii. ශ්‍රී ලංකාවේ උපත් අනුපාතය පහළ බැසීමට බලපා ඇති හේතු **තුනක්** විස්තර කරන්න. (ල.6)

iii. ජනසංඛ්‍යාව වියපත් වීම නිසා රටකට ඇතිවන සමාජ ආර්ථික බලපෑම් **තුනක්** විස්තර කරන්න. (ල.6)

iv. වර්තමානයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය හේතුවෙන් ලෝකයේ කාන්තාවන් මුහුණු දෙන අභියෝග **තුනක්** සාකච්ඡා කරන්න. (ල.6)

06) i. ජනාවාසයක් යනු කුමක් දැයි හඳුන්වන්න. (ල.2)

ii. ග්‍රාමීය හා නාගරික ජනාවාස අතර පවතින වෙනස්කම් පහත මාතෘකා යටතේ සංසන්දනය කරන්න.

- ජන සංඛ්‍යාව
- ආර්ථික කටයුතු
- දෛනික සංචලතාව (ල.6)

iii. විකීර්ණ ජනාවාස ඇති වීමට බලපාන සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ල.6)

iv. 'ශ්‍රී ලංකාවේ ජනාවාස වර්තමානයේ වෙනස් වෙමින් පවතී' කරුණු **තුනක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ල.6)

07) i. මෙහි දැක්වෙන ජන සංඛ්‍යා පිරමීඩ නිවැරදි ව හඳුනාගෙන නම් කරන්න. (ල.2)



A B C D

i. ලෝක ජන සංඛ්‍යාවේ අසම ව්‍යාප්තියට බලපාන සාධක **තුනක්** විස්තර කරන්න. (ල.6)

ii. සංක්‍රමණ කෙරෙහි බලපාන ඇද ගැනීමේ හා තල්ලු කිරීමේ සාධක (Push & Full Factors) **තුනක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ල.6)

iii. වර්තමාන ශ්‍රී ලංකාවේ සිදුවන ජාත්‍යන්තර සංක්‍රමණ (විගමන) හේතුවෙන් අනාගතයේ ඇතිවිය හැකි බලපෑම් **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.6)

08) i. නාගරීකරණය යනු කුමක් දැයි හඳුන්වන්න. (ල.2)

ii. නාගරීකරණයේ සාධනීය ලක්ෂණ **තුනක්** උදාහරණ සහිත ව විස්තර කරන්න. (ල.6)

iii. සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණය ආශ්‍රිත ගැටළු **තුනක්** විස්තර කරන්න. (ල.6)

iv. ශ්‍රී ලංකාවේ නාගරීකරණය ආශ්‍රිත ගැටළු විසඳීමට ගෙන ඇති පියවර **තුනක්** උදාහරණ දෙමින් විස්තර කරන්න. (ල.6)

12 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2023

භූගෝල විද්‍යාව - I පත්‍රය (පිළිතුරු)

I කොටස

01		**11**		**21**		**31**	
02		**12**		**22**		**32**	
03		**13**		**23**		**33**	
04		**14**		**24**		**34**	
05		**15**		**25**		**35**	
06		**16**		**26**		**36**	
07		**17**		**27**		**37**	
08		**18**		**28**		**38**	
09		**19**		**29**		**39**	
10		**20**		**30**		**40**	

(ලකුණු 1 x 40 - ලකුණු 40)

II - කොටස

01.

I. පළාත් මායිම / ප්‍ර.ලේ.කො. මායිම හෝ උපදිසාපති කොට්ඨාස මායිම / ග්‍රාම නිලධාරි කොට්ඨාස මායිම

මින් දෙකක් නිවැරදිව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2

II. මොහොර බැවුම/ශීඝ්‍ර බැවුම **ලකුණු 2**

III. වී - පොල් - වෙනත් වැවිලි/වෙනත් වගා - ගෙවතු

මින් දෙකක් නිවැරදිව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2

IV. ත්‍රිකෝණමිතික ස්ථානය - උපරිම උස මීටර් 219 **ලකුණු 1 බැගින් - ලකුණු 2**

V. සිතියම මුද්‍රණය කරන විට පරිමාණය වෙනස් විය හැකි බැවින් ගණනය කර නිවැරදි පිළිතුරට ලකුණු ලබා දෙන්න.

(දශම ස්ථාන එකක් +1 හෝ -1 වුවත් ලකුණු ලබා දෙන්න) - **ලකුණු 2**

VI. C - පාෂාණ උද්ගතය/ගල

D - වාරි ඇල **ලකුණු 1 බැගින් - ලකුණු 2**

VII. සෙ.මී. 6 දිග x සෙ.මී. 4 පළල චතුරස්‍රයක් ඇඳ තිබිය යුතුය. (ලකුණු 1)

ඒ තුළ මාර්ග විහිදී යන ආකාරය ඇඳ තිබිය යුතුය (ලකුණු 2)



ලකුණු 3

VIII. - පහත් බිම්/ගංගා නිම්න ආශ්‍රිතව - වී වගාව, ගෙවතු වගා

- උස්බිම්වල - වෙනත් වගාවන්
- අතරමැදි ප්‍රදේශවල/රළි බිම් ආශ්‍රිතව - ගෙවතු

උදාහරණ සහිතව නිවැරදි විස්තර කිරීමකට ලකුණු 6

02. පිළිතුරු සිතියම (ලකුණු 1 x 10 - ලකුණු 10)



III - කොටස

03.

i. දීර්ඝ විස්තරයකින් දැක්වෙන තොරතුරු සංක්ෂිප්ත ව දැක්වීම යි. බැහැරින් සිට බලන විට පෙනෙන පෘථිවියේ සම්මත චිත්‍රය සිතියම් ලෙස හැඳින්විය හැකි ය. භූ තලය මත ඇති භෞතික හා සංස්කෘතික තොරතුරු, පෘථිවි අභ්‍යන්තර තොරතුරු, ග්‍රහලෝක සහ තාරකා පිළිබඳ තොරතුරු මෙන් ම මිනිසා විසින් පෘථිවිය මතුපිට මනඃකල්පිත ව ගොඩනාගෙන ඇති පරිපාලන මායිම්, අක්ෂාංශ හා දේශාංශ යනාදිය ද සිතියම් මගින් නිරූපණය කෙරේ.

යනාදි නිවැරදි හැඳින්වීමකට ලකුණු 3

ii. - **භූ ලක්ෂණ සිතියම්**

උදා: - ශ්‍රී ලංකා 1:50,000 සිතියම් ශ්‍රේණිය
- ශ්‍රී ලංකා 1:10,000 සිතියම් ශ්‍රේණිය
- ඇමරිකා එක්සත් ජනපදයේ 1:24,000 සිතියම් ශ්‍රේණිය
- කැනඩාවේ 1:50.000 සිතියම් ශ්‍රේණිය
- එක්සත් රාජධානිය 1:50,000 සිතියම් ශ්‍රේණිය යනාදිය

- **තේමා සිතියම්**

උදා: - ශ්‍රී ලංකාවේ භූ විෂමතා ලක්ෂණ
- ශ්‍රී ලංකාවේ ජලවහනය
- ලෝකයේ ස්වාභාවික වෘක්ෂලතා ව්‍යාප්තිය
- ලෝකයේ දේශපාලන බෙදීම් යනාදිය

සිතියම් වර්ගය නිවැරදි ව නම් කර උදාහරණ දෙකක් දැක්වීමට ලකුණු 1½ බැගින් - ලකුණු 3

iii. **තේමා සිතියම්** - තේමා සිතියමක් එක් සුවිශේෂී කරුණක් දැක්වීම සඳහා පමණක් නිර්මාණය කර ඇත. සිතියමේ නිරූපිත තොරතුරු අනුව සිතියමට අදාළ මාතෘකාව දක්වා තිබේ.

භූ ලක්ෂණ සිතියම් - භූ ලක්ෂණ සිතියමක් යනු භෞතික හා සංස්කෘතික ලක්ෂණ ඇතුළත් වන සේ සකස් කරන ලද සිතියමකි.

යනාදි වශයෙන් මින් එක් වර්ගයක ලක්ෂණ නිවැරදිව පැහැදිලි කිරීමට ලකුණු 4

iv. - විවිධ වර්ගයේ ඡායාරූප ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ දී දැනට භාවිත කරනු ලැබේ. සාමාන්‍ය කැමරාවකින් ගන්නා භූතල ඡායාරූප විශාල වශයෙන් භාවිත වේ. පොත්පත්වල හා ප්‍රකාශනවල ඇතුළත් ඡායාරූප, රූපවාහිනිය හා පරිගණකය වැනි දෘශ්‍ය මාධ්‍යවල භාවිත කරන ඡායාරූප මේවා ය. ගුවන් ඡායාරූප භාවිත වූයේ අහස් යානය නිපදවීමෙන් පසු ව ය. යුද්ධ කටයුතුවල දී හා සිතියම් නිර්මාණය සඳහා මේවා ප්‍රයෝජනයට ගන්නා ලදි.

- චන්ද්‍රිකා ප්‍රතිබිම්බ නූතන ක්‍රම-ශිල්පයක් ලෙස දැක්විය හැකි ය. මෙම දත්ත ඉතා ම නිවැරදි එසේ ම විවිධ කාලවලට අදාළ දත්ත ද මේ මගින් ලබා ගත හැකි ය.

යනාදි වශයෙන් ඡායාරූප හා ප්‍රතිබිම්භ භාවිත කරන ආකාරය නිවැරදි පැහැදිලි කිරීමකට ලකුණ 5

04.

i. පරිගණක දෘඪාංග හා මෘදුකාංග භාවිත කරමින් භූ අවකාශීය තොරතුරු ඇතුළත් කිරීම, ගබඩා කිරීම, අවශ්‍ය පරිදි සකස් කිරීම හා නිරූපණය කිරීම සඳහා භාවිත කරන ක්‍රමවේදයක් ලෙස භූගෝලීය තොරතුරු පද්ධතිය හැඳින්විය හැකි ය.

නිවැරදි හැඳින්වීමකට ලකුණු 3

ii. **a - දෘඪාංග** - චුම්බක තැටි / අංකන ඵලකය / සුපිරික්සන / තිර සංඛ්‍යාංකනය / තිර සංඛ්‍යාංකනය / මුද්‍රණ යන්ත්‍රය / මධ්‍ය සැකසුම් ඒකකය / සසම්භාවී මතකය / දෘඪ තැටි

b - මෘදුකාංග - Mapinfo / Arc view GIS / Arc GIS / Intergraph / Global Mapper / GRASS / SAGA GIS / ILWIS / IDRISI

c - භාවිත කරන්නන් - ක්‍රියාත්මක කරවන්නන් / තාක්‍ෂණික විශේෂඥයන් / දත්ත විශ්ලේෂකයන් / පද්ධති ඉංජිනේරුවරුන් / කළමනාකරණ සේවක මණ්ඩල

එක් වර්ගයක උදාහරණ දෙකකට ලකුණු 1 බැගින් - ලකුණු 3

iii. **- දෛශික දත්ත ආකෘතිය**

සියලු ම භූගෝලීය ලක්ෂණ, ලක්ෂ්‍ය, රේඛා, හා කලාප නැති නම් බහු අස්‍රවලින් යන මූලික සංකේතවලින් නිරූපණය කරයි

- ලක්ෂ්‍ය - යම් භූමියක පිහිටා ඇති ගොඩනැගිල්ලක් නැතිනම් ළිඳක් ආදිය
- රේඛා - මාර්ග, ගංගා, වාරිමාර්ග ආදිය
- කලාප/බහු අස්‍ර - ජලාශයක්, වගාබිමක් වැනි ක්ෂෙත්‍රඵලයක් සහිත ලක්ෂණ



- සිව්රස් දත්ත ආකෘතිය

මෙම ක්‍රමයේ දී සිතියම් ප්‍රදේශය තීරු හා පේළි රටාවකට පරිවර්තනය කොට සැම කොටසක් ම නිරීක්ෂණ ඒකක වශයෙන් සලකා ඒවාට යම් සංඛ්‍යාත්මක වටිනාකම් ලබාදීම සිදු කරයි.

ආකෘති වර්ග දෙක නම් කිරීමට ලකුණු 2 + ඉන් එකක් නිවැරදි ව පැහැදිලි කිරීමට ලකුණු 3 - ලකුණු 5

iv. - සිතියමක් තුළ ඇති විවිධ තොරතුරු එක් එක් තේමා ඔස්සේ සිතියම් තල ලෙස ගබඩා කරගැනීම හා නැවත ඒවා වෙන වෙන ම පරිශීලනය කරගැනීමට හැකි වීම
- ත්‍රිමාණ සිතියම් ඇසුරෙන් තොරතුරු විශ්ලේෂණයක් කිරීමට හැකි වීම
- අවකාශීය දත්ත පමණක් නොව අවකාශීය නොවන දත්ත විශ්ලේෂණයකට ඇති හැකියාව
- කෙටි කාලයක දී භූගෝලීය දත්ත යාවත්කාලීන (Update) කිරීමේ හැකියාව
- භූගෝලීය දත්තවල නිවැරදි පිහිටීම, පරිමාණය, වර්ගඵලය වැනි පරිමිතීන් ඉතා නිවැරදි ව ලබාගැනීමට හැකියාව
- පුද්ගල බද්ධ දෝෂ GIS සිතියම්වල අවම වීම
- විශාල සිතියම් ප්‍රමාණයක් ගබඩා කිරීම, පරිහරණය, ගෙනයාම වැනි කටයුතු ඉතා පහසුවෙන් කළ හැකි වීම
- භූගෝල විද්‍යාවට පමණක් නොව, පරිසර, කෘෂි, ඉංජිනේරු, සමාජ වැනි වෙනත් විෂයයන්ට ද භාවිත කළ හැකි වීම

යනාදි කරුණු දෙකක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4

05.

i. **A** - කොත් කන්ද **B** - කපොල්ල **C** - සානුව **D** - ගං දඟරය

නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 4

ii. a. 2 cm x 2 cm ප්‍රමාණයේ චතුරස්‍රයක් ඇඳ තිබිය යුතු ය



ලකුණු 2

b. 1:50,000 රේඛීය පරිමාණය නිවැරදිව ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න



සෙ.මී. 10 රේඛාව - ලකුණු 1
සෙ.මී. 2 බැගින් සමාන කොටස් බෙදීම - ලකුණු 1
කි.මී. නිවැරදිව නම් කිරීම - ලකුණු 1
පළමු උප කොටස පමණක් මිලි මීටර් 2 බැගින් බෙදීම - ලකුණු 1
1:50,000 පරිමාණය සඳහන් කිරීම - ලකුණු 1
ලකුණු 5

iv.



නිවැරදි ව ඇඳ නම් කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 4

06.

i. පෘථිවියට ඉහළින් කක්ෂගත කර ඇති චන්ද්‍රිකා පද්ධතියක් මඟින් පෘථිවියේ ඕනෑම ස්ථානයක කිසියම් වස්තුවක හෝ කිසියම් රූපමිතියක හෝ පිහිටීම ඉතා ම නිවැරදි ව ඛණ්ඩාංකගත ව හඳුනාගැනීම සඳහා නිර්මාණය කොට ඇති යාත්‍රණ පද්ධතිය ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය ලෙස හඳුන්වයි.

නිවැරදි හැඳින්වීමකට ලකුණු 3

ii. A - හවායි දූපත් B - ඇසෙන්ෂන් දූපත් C - දියාගෝ ගාර්ෂියා දූපත් D - ක්වාලෙයින් දූපත්

නිවැරදි ව නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 4

iii. චන්ද්‍රිකා තොරතුරු ලබාගැනීම හා මෙහෙයවීම ප්‍රධාන පාලක මධ්‍යස්ථානයකින් හා මෙහෙයුම් මධ්‍යස්ථාන හතරකින් ද ග්‍රාහක (Antenna) මධ්‍යස්ථාන කීපයකින් ද සිදු වේ.

- ප්‍රධාන මෙහෙයුම් මධ්‍යස්ථානය (Master Control Station) - ඇමෙරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝවල පිහිටා ඇත
- මෙහෙයුම් මධ්‍යස්ථාන (Monitoring Stations) - හවායි දූපත්, ඇසෙන්ෂන්, දියාගෝ ගාෂියා සහ ක්වායින්
- ඇන්ටනා මධ්‍යස්ථාන (Antenna Stations) - ඇසෙන්ෂන්, දියාගෝ ගාෂියා, ක්වායලෙයින් සහ කොලරාඩෝ ස්ප්‍රින්ග්ස්

මෙවැනි නිවැරදි හැඳින්වීමකට ලකුණු 4

iv.

- දත්තවල නිවැරදිතාව පිළිබඳ ගැටළු (විශේෂයෙන් මාර්ගවල)
- තාක්ෂණික දැනුම්වත්භාවය දැනුම පිළිබඳ ගැටළු
- සම්පත් සඳහා වන පිරිවැය
- භාවිතය පිළිබඳ ඇති ගැටළු
- ආකල්ප හා අදහස් වෙනස් වීමට ඇති අකැමැත්ත
- ගතානුගතික හා සාම්ප්‍රදායික ක්‍රම ශිල්පවලින් අයින් වීමට හෝ වෙනස් කිරීමට ඇති අකැමැත්ත
- දත්ත ප්‍රමිතිකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම
- දත්ත රැස්කරන ආයතන අතර සම්බන්ධතාවක් නොමැති වීම
- දත්ත බෙදා හදා ගැනීමට හෝ හුවමාරුවට ඇති අකැමැත්ත

මෙවැනි ගැටළු දෙකක් නිදසුන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2½ බැගින් - ලකුණු 5

❊❊❊❊

12 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2023
භූගෝල විද්‍යාව - II පත්‍රය (පිළිතුරු)
I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01.

i. ජල චක්‍රය යනු සූර්ය ශක්තිය ආධාරයෙන් ජලය එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට චක්‍රාකාරයෙන් සංසරණය වන ක්‍රියාවලිය යි. ශිලාගෝලය තුළ ද්‍රව හා ඝන (අයිස්) තත්ත්වයෙන් ද වායුගෝලය තුළ ජලවාෂ්ප සහ වලාකුළු ලෙස ද ජෛවගෝලයේ ශාක සහ සත්ත්ව සිරුරු තුළ ද අන්තර්ගත ව පවතින ජලය, මෙම පද්ධති අතර චක්‍රීය ව සංසරණය වෙමින් පවතී. එම ක්‍රියාවලිය ජලචක්‍රය ලෙස හැඳින්වේ.

නිවැරදි හැඳින්වීමකට ලකුණු 2

ii.



- භූතලය සහ ජලතල මත තිබෙන ජලය **වාෂ්පීකරණය** වීම
- ශාකපත්‍රවල ජලය **උත්ස්වේදනය** වීම
- ජලවාෂ්ප ලෙස පවතින එම ජලය **ඝනීභවනය** වී **වර්ෂණ** ක්‍රියාවලිය මගින් නැවත පොළොවට පතිත වීම
- වර්ෂණය මගින් පෘථිවිය මතට ලැබෙන ජලයෙන් කොටසක් භූමිය මතුපිට ගලායාම **අපධාවය**
- කොටසක් භූමිය තුළට **කාන්දු වීම**

රූපසටහන සඳහා ලකුණු 3
සංරචක දෙකක් විස්තර කිරීමට ලකුණු 1½ බැගින් - ලකුණු 3

iii.
- වර්ෂාව හා අධිධාවිතය නිසා භූමියේ අනුක්‍රමණය වෙනස් වෙයි.
- වැසි ජලය මඟින් හුනුගල් ද්‍රාවණය වී එම ප්‍රදේශවල භූ දර්ශනය වෙනස් වෙයි.
- හිම පතනය නිසා ධ්‍රැවාසන්න හා ඉහළ කඳු බෑවුම් ආශ්‍රිත නිම්න ප්‍රදේශවල ඛාදිත හා නිධි සාධිත භූරූප නිර්මාණය වේ.
- තද වැහි නොකඩවා පැවතීමෙන් ගලා යන ජලය මඟින් විවිධ භූ රූප නිර්මාණය කරයි.
- අධිධාවිතය හා කාන්දු වීම මඟින් භූ දර්ශනය මතුපිට හා මවු පාෂාණය ජීරණය කර පස නිර්මාණ ක්‍රියාවලියට දායක වෙයි.
- අධිතීව්‍රතාවකින් නිතර නිතර ඇති වන වර්ෂණය හේතු කොට ගෙන උල්පත් රාශියක් ඇති වේ.

ක්‍රියාවලි තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iv. - පිරිසිදු පානීය ජල හිඟ වීම
- වගාවන් සඳහා ජලය නොමැතිවීම/හිඟවීම
- කර්මාන්ත සඳහා ජලය හිඟවීම
- අපිරිසිදු ජලය පානය කිරීමෙන් විවිධ රෝගාබාධ වැළඳීම
- ගෘහස්ත කටයුතු සඳහා ජලය නොමැතිවීම/හිඟවීම
- රටවල්/ප්‍රදේශ අතර ගැටුම්/අර්බුද නිර්මාණය වීම

නිදසුන් තුනක් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

02.

i. **පාංශු නිර්මාණයට බලපාන සාධක**

- මවු පාෂාණ
- දේශගුණය
- භූ විෂමතාව
- කාලය
- ජලය හා ජලවහනය
- ශාකවල, සත්ත්වයන්ගේ හා ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරිත්වය

මින් සාධක හතරක් නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 2

ii. a. **තෙත් කලාපයට අයත් පස - රතු දුඹුරු ලැටසොල් පස**

මනා ජලවහනයකින් යුක්ත ය. සියුම් වයනයකින් යුක්ත අතර රතු දුඹුරු වර්ණය වේ. නයිට්‍රජන්, පොටෑසියම්, කැල්සියම් හා මැග්නීසියම් මධ්‍යස්ථ ප්‍රමාණයකින් යුක්ත මෙම පස සශ්‍රීකත්වයෙන් ඉහළ යි. කඳු සහ රැලි භූ දර්ශනය සහිත ප්‍රදේශවලත් නිම්න භූ දර්ශනය සහිත ප්‍රදේශවලත් බහුල ව දක්නට ලැබේ. මහනුවර, කෑගල්ල දිස්ත්‍රික්කවල වැඩි ප්‍රදේශයක ද මාතලේ දිස්ත්‍රික්කයේ නිරිත දිශානුගත ව ද ව්‍යාප්ත ව ඇත. කොකෝවා, කෙසෙල් වගාව සඳහා ද ඉතා යෝග්‍ය වේ. මෙම පස කොළඹ, කළුතර, ගාල්ල දිස්ත්‍රික්කවල ප්‍රධාන ගංගා අසබඩ වගුරු සහිත ප්‍රදේශවල ද ව්‍යාප්ත ව ඇත.

b. වියළි කලාපයට අයත් පස - රතු දුඹුරු පස

සාමාන්‍ය ගැඹුරකින් හා මනා ජලවහනයකින් යුක්ත ය. තද දුඹුරු පැහැති මෙම පසෙහි Aමහල සෙ.මී. 13 - 25 ඝනත්වයකින් හා මධ්‍යස්ථ සියුම් වයනයකින් යුක්ත වේ. ප්‍රධාන වශයෙන් තිරුවාණා, බොරලු හෝ යගල් අඩංගු වේ. ඓන්ද්‍රීය ද්‍රව්‍යවල කැල්සියම් සහ මැග්නීසියම් අඩංගු වන අතර නයිට්‍රජන් ප්‍රමාණය අඩු ය. මෙම පස වියළි කලාපයට අයත් අනුරාධපුර, පොළොන්නරුව, වව්නියාව, හම්බන්තොට, මොනරාගල හා යාබද දිස්ත්‍රික්කවල ඇතැම් ප්‍රදේශවල ව්‍යාප්ත ව පවතී. ධාන්‍ය වර්ග මුං, මෑ වැනි ඇට වර්ග, තෙල් ඇට හා වෙනත් අතිරේක ආහාර බෝග වගා සඳහා යෝග්‍ය වේ.

පාංශු ගණ දෙක නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 3 බැගින් - ලකුණු 6

iii. - වල් නාශක හා කෘමිනාශක භාවිත කිරීමේ දී
- රසායනික පොහොර භාවිතයේ දී
- බිම් සැකසීමේ දී
- අස්වනු නෙලීමේ දී (විශේෂයෙන් අල වර්ග)
- ජල සම්පාදන කටයුතුවල දී

බලපාන ආකාරය කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iv. මැණික්, මිනිරන්, මැටි, පොස්පේට් (ඇපටයිට්), ඛනිජ වැලි යනාදි ලෝහමය නොවන ඛනිජවල දායකත්වය නිදසුන් සහිත ව විස්තර කර තිබිය යුතුය.

නිවැරදි ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

03.

i. A - කිලවෙයා/මෝනාලෝආ
B - අන්සෙන්/ෆුජි
C - ක්‍රැකටෝවා/ඩෙම්පෝ
D - රුවාපෙහු

නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 2

ii. **නිෂ්ක්‍රාන්ත යමකම**
- යමහල් කේතු
- යමහල් අළු කේතු
- සංයුක්ත කේතු
- කල්දේරාව
- ලාවා සානු
- ලාවා පේනු



භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iii. **නිධි සාධිත භූ රූප**
- ගං දගර
- හැඩපළු ගංගා
- ඩෙල්ටා
- දුනු විල්
- ගංකණ්ඩි
- දියළු අවාන්
- පිටාර තැන්න



භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iv. - සංචාරක කර්මාන්තය
- තැනිතලා ආශ්‍රිත ව සත්ත්ව පාලනය
- ලම්භ නිම්නවල දිය ඇළි ආශ්‍රිත ව ජල විදුලිය නිෂ්පාදනය
- ෆියෝඩ වෙරළ ආශ්‍රිත ව ධීවර කර්මාන්තය, නැව් කර්මාන්තය
- හිම ක්‍රීඩා, ත්‍රාසජනක ක්‍රීඩා

ආදි ක්‍රියාකාරකම් තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

04.

i. a. වායුගෝලීය පීඩනය - බැරෝමීටරය / වායු පීඩනමානය - මිලිබාර් mb

b. සුළඟේ වේගය - අනිලමානය - පැයට කිලෝමීටර් kmph

උපකරණ හා ඒකකය නිවැරදි ව සඳහන් කර ඇත්නම් ලකුණු ½ බැගින් - ලකුණු 2

ii. - සූර්ය විකිරණ තීව්‍රතාව
- අක්ෂාංශගත පිහිටීම
- සාගර හා ගොඩබිම් ව්‍යාප්තිය
- සාගර ප්‍රවාහ
- කඳු බාධක
- අඩු පීඩන හා වැඩි පීඩන පද්ධතිවල පිහිටීම
- අන්තර් නිවර්තන අභිසරණ කලාපය

වැනි සාධක තුනක් පැහැදිලි කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iii. - නිවර්තන තෙත් දේශගුණය Af
- නිවර්තන මෝසම් දේශගුණය Am
- නිවර්තන තෙත් සහ වියළි දේශගුණය හෙවත් නිවර්තන සැවානා දේශගුණය Aw

දේශගුණ වර්ග තුන නම් කිරීමට ලකුණු 3

එක් වර්ගයක ලක්ෂණ විස්තර කිරීමට ලකුණු 3

iv. - කෘෂිකාර්මික කටයුතු සිදු කරන ආකාරය
- වගා කරනු ලබන බෝග වර්ග
- වගා කන්න ක්‍රමය
- කඳුකර ප්‍රදේශ ආශ්‍රිත ව නිවාස, ගොඩනැගිලි ආදියේ ඉදිකිරීම්
- සංස්කෘතික උත්සව ආදිය (අලුත් අවුරුද්ද, තෛපොංගල්, වස් වැසීම ආදිය)
- ආහාර පරිභෝජන රටා

ආදි කරුණු තුනක් නිදසුන් සහිත ව විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

05.

i. - ළමා යැපුම් අනුපාතය ක්‍රමයෙන් පහළ බසිමින් පවතී
- වැඩිහිටි යැපුම් අනුපාතය ක්‍රමයෙන් ඉහළ නගිමින් පවතී
- මුළු යැපුම් අනුපාතය ද ක්‍රමාණුකූලව පහළ බසිමින් පවතී
- වැඩි ම ළමා යැපුම් අනුපාතයක් 1963 වර්ෂයේ වාර්තා වී ඇත
- 1963 වර්ෂයේ දී සමස්ත යැපුම් අනුපාතය ඉහළ ම අගයක් (90.5) වාර්තා කර ඇත

මෙවැනි ලක්ෂණ දෙකක් නම් කිරීමට ලකුණු 1 බැගින් - ලකුණු 2

ii. - කාන්තාවන් වැඩිදුර අධ්‍යාපනය ලැබීම
- උපත් පාලන ක්‍රම භාවිතය
- විවිධ සංස්කෘතික ආගමික මතවාද
- පුංචි පවුල රත්තරන් වැනි සංකල්ප සමාජගත වීම
- ආර්ථික අපහසුතා

යනාදි හේතු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iii. - වියපත් ජනසංඛ්‍යාව වැඩිවීම රජයේ වියදම් වැඩි වීමට හේතු වේ
- ශ්‍රම බලකාය හැකිලීමට ලකම්ම
- සුබ සාධන පහසුකම් සැලසීමට සිදු වීම
- මානසික සෞඛ්‍ය යහපත් ව පවත්වා ගැනීමට අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කිරීමට සිදුවීම

යනාදි බලපෑම් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iv. - අතීතයේ දී ස්ත්‍රියට පැවරී තිබුණු කාර්යවලට වඩා වැඩි ප්‍රමාණයක් වර්තමානයේ දී ඇයට පැවරී තිබීම
- පුරුෂයන් ආදායම් ඉපැයීම ප්‍රමාණවත් නොවීම නිසා කාන්තාව ද මුදල් ඉපයීමට සිදුවීම
- ගතානුගතික ලක්ෂණ මත ස්ත්‍රීන් කෙරෙහි සීමා පැනවීම් සිදුවීම
- වළක්වා ගත හැකි මරණ ඉහළ යාම (ගර්භණී බව, දරුප්‍රසූතිය සහ ගබ්සා කිරීම් ආශ්‍රිත සංකූලතා ආදිය)
- දේශපාලනය තුළ ලබාගෙන ඇති ඉඩකඩ සීමිත වීම
- ස්වාමියා මිය ගිය පසු රැකවරණය නොමැති ව හුදෙකලාව ජීවත්වීමට සිදු වීම

ආදී අභියෝග තුනක් සඳහා ලකුණු 2 බැගින් - ලකුණු 6

06.

i. ජනාවාස යනු පොළෝතලයේ මිනිසා විසින් ගොඩනඟන ලද වාසභූමියකි. නිවාස, ගොඩනැගිලි පමණක් නොව වැටවල්, මාර්ග, ගබඩා, ගොවිපළවල් ආදි සියල්ලක් ම ඇතුළත් ව, මිනිසා විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලු දෙයින් ද විවිධත්වයක් ඇති පුද්ගලයන් සමූහයකින් ද සමන්විත වූවකි. මිනිසා විසින් භූ තලය මත පිහිටුවන ලද දෘශ්‍ය සටහනක් ලෙස ජනාවාස සරල ව අර්ථ දැක්විය හැකි ය.

නිවැරදි හැඳින්වීමකට ලකුණු 2

ii.

	ග්‍රාමීය ජනාවාස	**නාගරික ජනාවාස**
ජන සංඛ්‍යාව	සාපේක්ෂ වශයෙන් අඩු ය	සාපේක්ෂ වශයෙන් වැඩි ය
ජනඝනත්වය	අඩු ය	අධික ය
ආර්ථික කටයුතු	අඩු ය. ප්‍රධාන වශයෙන් ප්‍රාථමික ආර්ථික කටයුතු	ද්විතීයක, තෘතීයක, චාතුර්ථක ආර්ථික කටයුතු
දෛනික සචලතාව	අඩු ය	විවිධ ප්‍රදේශවලින් උදේ වරුවේ ඇතුළට ද සවසට පිටතට ද සචලතාව ඇත
සංක්‍රමණය	අඩු ය	වැඩි ය

වෙනස්කම් තුනක් සංසන්දනය කර දැක්වීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iii. - ජන සංඛ්‍යාව අඩු වීම
- විශාල ඉඩම් පැවතීම
- සාම්ප්‍රදායික ව හිමි වූ විශාල ඉඩම් තිබීම
- යටිතල පහසුකම්වල නොදියුණු බව
- රළු/දුෂ්කර භූ විෂමතාවක් පැවතීම (පිවිසීමේ අපහසුතා)
- දේශගුණික කටුකත්වය

යනාදි සාධක දෙකක් විස්තර කිරීමට ලකුණු 3 බැගින් - ලකුණු 6

iv. - ග්‍රාමීය ජනාවාස අඩු වී, නාගරික හා ගැමි නාගරික ජනාවාස වැඩි වේ.
- නාගරික ජනාවාසවල ප්‍රසාරණයත් සමග භූමි පරිභෝගය ද වෙනස් වේ. කෘෂිකාර්මික බිම් සේවා පහසුකම් සඳහා යොදා ගැනේ.
- නාගරික ජනාවාස ගෝලීයකරණයේ බලපෑම්වලට ලක් වී තිබීම
- නාගරික හා ගැමි නාගරික ජනාවාසවල නිවාස සිරස් අතට ව්‍යාප්ත වීම නිසා ජනපීඩනය වැඩි වී සම්පත් හා සේවා මත සිදු වන පීඩනය ද වැඩි වීම

යනාදි කරුණු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

07.

i. A - ස්ථාවර පිරමීඩය B - ප්‍රාථමික පිරමීඩය C - ප්‍රසාරණ පිරමීඩය D - හායන පිරමීඩය

පිරමීඩ හතර නිවැරදි ව නම් කිරීමට ලකුණු ½ බැගින් - ලකුණු 2

ii. **භෞතික සාධක**

- දේශගුණය
- භූවිෂමතාව
- ජල පහසුකම්
- පස
- ස්වාභාවික සම්පත්
- ස්වාභාවික වෘක්ෂලතා ව්‍යාප්තිය

මානුෂ සාධක

- ආර්ථික කටයුතු
- නාගරීකරණය
- සන්නිවේදනය
- දේශපාලන හේතු යනාදිය

භෞතික හා මානුෂ සාධකවලින් තුනක් විස්තර කර තිබිය යුතුය

යනාදි සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iii. - **තල්ලු කිරීමේ සාධක** (ප්‍රදේශයක් හැරයාමට බලපාන සාධක)
- යුද්ධ තත්ත්ව
- පාරිසරික සාධක (ආපදා)
- රැකියා හිඟය ආදිය

- **ඇද ගැනීමේ සාධක** (ප්‍රදේශය වෙත ඇද ගැනීමේ සාධක)
- නිදහස
- රැකියා බහුලවීම
- යටිතල පහසුකම් දියුණුව
- හිතකර දේශගුණය ආදිය

ඇද ගැනීමේ හා තල්ලු කිරීමේ සාධක තුනක් තිබිය යුතුය

යනාදි සාධක තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

12 ශ්‍රේණිය - තෙවන වාර පරීක්ෂණය - 2023
භූගෝල විද්‍යාව - II පත්‍රය (පිළිතුරු)

iv. - ශ්‍රම හිඟයක් ඇතිවීම
- වෘත්තිය පුහුණුව හා හැකියාව සහිත පිරිස් අඩු වීම
  - වෛද්‍යවරුන්/හෙදියන් හිඟවීමෙන් රෝහල්වල ගැටළු
  - ගුරුවරුන් හිඟ වීමෙන් පාසල් පද්ධතියේ ගැටළු
  - ඉංජිනේරුවන් හිඟවීමෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ගැටළු
- බුද්ධිමතුන් රට හැර යාම
- විශ්වවිද්‍යාල, පර්යේෂණ ආයතනවල කටයුතුවලට බාධා පැමිණීම
- ව්‍යවසායකයන් රටට අහිමි වීම

යනාදි බලපෑම් තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

08.

i. - නාගරීකරණය යනු අඛණ්ඩ ක්‍රියාවලියකි. සාපේක්ෂ ව ආර්ථික හා සේවා පහසුකම් ඇති ප්‍රදේශයක් තුළට විශාල වශයෙන් ජනයා ස්ථිර පදිංචිය සඳහා ඒකරාශි වීම නිසා නාගරීකරණය ඇති වේ. නාගරික ජන සංඛ්‍යාවේ නිරපේක්ෂ වර්ධනය (Urban Growth) 'නාගරික වර්ධනය' ලෙෂ හඳුන්වනු ලබයි. එය නාගරීකරණයට වඩා වෙනත් අර්ථයක් ගෙන දේ. නාගරික ජනසංඛ්‍යාව, මුළු ජනසංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස දැක්වීම නාගරීකරණය යි.

මෙවැනි නිවැරදි හැඳින්වීමකට ලකුණු 2

ii. නාගරික ප්‍රදේශවලින් ආරම්භ වී අනෙකුත් ප්‍රදේශ කරා විවිධ අංශ ව්‍යාප්ත වීම
- සන්නිවේදනය
- සංස්කෘතිකමය දෑ
- ආර්ථිකමය හා වානිජ කටයුතු
- දේශපාලනික
- ප්‍රවාහනය
- විද්‍යාත්මක දැනුම හා සොයා ගැනීම්
- ආකල්පමය වෙනස්කම්
- අධ්‍යාපනික
- සෞඛ්‍යමය හා සුබ සාධනය
- තාක්ෂණය හා තාක්ෂණික දැනුම

කරුණු තුනක් විස්තර කිරීමට කුණු 2 බැගින් - ලකුණු 6

iii. - නාගරික ප්‍රදේශ අක්‍රමවත් ලෙස පැතිරීම
- නිවාස හිඟය
- පැල්පත් හා මුඩුක්කු නිවාස වර්ධනය
- ජල ගැටලු
- ඝන අපද්‍රව්‍ය ගැටලු
- නාගරික පරිසර දූෂණය
- අධික ජන සංඛ්‍යා තදබදය
- විරැකියාව
- ප්‍රවාහණ ගැටලු
- මල අපවහනය පිළිබඳ ගැටලු
- නාගරික අපරාධ

යනාදි ගැටළු තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6

iv. - නාගරික යටිතල පහසුකම් සංවර්ධනය
  (නිවාස, අපවහන පද්ධති, ජල සම්පාදනය, මහා මාර්ග ආදි)
- නාගරික ප්‍රජාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම
  (සෞඛ්‍ය, අධ්‍යාපනය, ආරක්ෂාව, පෝෂණය ආදායම් මාර්ග)
  - කොළඹ කළුතර, ගම්පහ නගර සම්බන්ධ වූ බස්නාහිර පළාත් මහා නාගරික කලාප සංවර්ධන වැඩසටහන
  - නිවාස දස ලක්ෂයේ වැඩසටහන (1984-1986)
  - නිවාස 15 ලක්ෂයේ වැඩසටහන (1990-1994)
- කැලිකසළ හා අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නාගරික සෞඛ්‍ය හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පිරිසිදු නගර නිර්මාණය සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- නාගරික සමාජ විරෝධී ක්‍රියාකාරකම් වළක්වා ගැනීමටත්, නාගරික අපරාධ අඩුකරලීමට වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

යනාදි පියවර තුනක් විස්තර කිරීමට ලකුණු 2 බැගින් - ලකුණු 6